# සුපර්ස්ටාර් පිටුපස

සුපර්ස්ටාර් යනු හුදු සංගීත ප්‍රසංගයක්වත්, ආධුනික ගායකයන්ට (ගායිකාවෝ මුලදී ම ඉවත්කරනු ලැබූහ) අත දීමටවත්, සිරස රූපවාහිනියට මුදල් සොයා ගැනීමටවත් ප්‍රචාරය කෙරුණු වැඩසටහනක් නොවන බව දැන් දැන් යම් පිරිසක් හෝ තේරුම් ගනිමින් සිටීම තරමක සුබ ලකුණකි. හැංගි හැංගී වෙස්මුහුණු බැන්ද ද නටන්නට වන්නේ එළියේ යන සිංහල පිරුළ මහරාජා සමාගමේ අධිකාරීන් දන්නේ දැයි අපි නො දනිමු. මේ වනවිට ද සුපර්ස්ටාර් ප්‍රසංග නිසා ඇති වී තිබෙන තත්ත්වය මෙරට ජනතාව, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන් සැලකිල්ලට ගත යුතුය. කොළඹ ප්‍රසිද්ධ බෞද්ධ විද්‍යාලයක පවත්වන ලද සුපර්ස්ටාර් ප්‍රසංගය කෙළවර වී ඇත්තේ විද්‍යාලයීය ශාලාවේ ගින්නක් ඇති වී එහි භාණ්ඩ සුන්නත්දූලි කරමින් ය. සුපර්ස්ටාර් යනු ඇමරිකන් සංගීත වැඩසටහනක කොපියක්, අනුකරණයක් බව කියැවෙයි. මෙරට බොහෝ නිර්මාණශීලී රූපවාහිනී වැඩසටහන් යැයි කියැවෙන හරඹ හුදු අනුකරණ, ඇතැම් විට නම පවා දන්නා අයට එහි අමුත්තක් නොදැනෙනු ඇත. රූපවාහිනී වැඩසටහනක් වැඩසටහන් පමණක් නොව ජාත්‍යන්තර සිනමා තෑගි දිනාගන්නා ඊනියා සම්භාව්‍ය හෙවත් කුපාඩි චිත්‍රපට ද බටහිර ඩීවීඩී තැටි කිහිපයක් එකතු කිරීමෙන් (සංස්කරණය කිරීමෙන්) ලබාගන්නා කුණුහරුප බව ද දන්නෝ දනිති. මෙරට බිහි වී ඇතැයි කියන අග්‍රගණ්‍ය නවකතා කෙටිකතා කීයක් බටහිර කෘතිවල පිටපත් දැයි දැනගත හැක්කේ ඒ ඊනියා කතුවරුන්ගෙන් ම ය. පසුගිය දා එක්තරා අග්‍රගණ්‍ය සිංහල සිනමා කෘතියක් යැයි හඳුන්වනු ලැබූ චිත්‍රපටයක් රුසියන් චිත්‍රපටයක අග්‍රගණ්‍ය පිටපතක් බව දැන ගැනීමට ලැබී ඇත. පිටරට චිත්‍රපට නරඹා ඒ අනුව රඟපාන ලෙසට උපදෙස් දී ඇත්තේ අප්‍රබුද්ධ යැයි සැලකෙන චිත්‍රපට අධ්‍යක්ෂවරුන් පමණක් නොවෙයි. ඊනියා ප්‍රබුද්ධ අධ්‍යක්ෂකවරු ද එවැනි උපදෙස් නළු නිළියන්ට දෙති. එහෙත් ඒ හින්දි හෝ දෙමළ හෝ චිත්‍රපට බැලීමෙන් පසුව නම් නොවෙයි. ඒ වෙනුවට ඊනියා ප්‍රබුද්ධ අධ්‍යක්ෂවරු නළු නිළියන්ට බටහිර වීසිඩී තැටි නැරඹීමට දෙති. එබැවින් මෙරට ඊනියා ප්‍රබුද්ධයන්ගේ තරම දන්නා අපට සුපර්ස්ටාර් යනු ඇමරිකන් වැඩසටහනක පිටපතක් වීම පුදුමයට කරුණක් නොවෙයි.

සුපර්ස්ටාර් ප්‍රසංගවල අරමුණ ජාතියේ අධ්‍යාත්මය සුන්නත්දූලි කිරීම ය. ශාලාවක භාණ්ඩ ගින්නෙන් සුන්නත්දූලි වීම ද විශාල පාඩුවක් නමුත්, ඒ භාණ්ඩ නැවත නිෂ්පාදනය කළ හැකි ය. එහෙත් ජාතියේ ආධ්‍යාත්මය සුන්නත්දූලි වුවහොත් ඒ නැවත නිෂ්පාදනය කළ හැකි නො වෙයි. ඊනියා සම්භාව්‍ය හෙවත් කුපාඩි චිත්‍රපට නිෂ්පාදනය කෙරෙන්නේ ද ජාතියේ අධ්‍යාත්මය විනාශ කිරීමටය. එහිදී ඔවුහු එක්කෝ ජාතිකාභිමානයට සරදම් කරන, හමුදාවේ ධෛර්යය හීනකරන චිත්‍රපට නිෂ්පාදන කරති. නැතහොත් අම්මා පුතා සමග යහන්ගත වන චිත්‍රපට නිපදවති. එවැනි චිත්‍රපටවල රඟපෑමට යොදාගන්නා කුඩා ළමයින්ගේ මානව අයිතිය ගැන මේ පොරවල් වූ අධ්‍යක්ෂවරුන් කියන්නේ කුමක්ද? ඒ කුඩා නළුවන්ගේ මනස්වලට මනසට සුදුසු නොවන අදහස් දීමෙන් ප්‍රබුද්ධයන් යැයි කියාගන්නා බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ හා එහි ප්‍රතිඵලයක් වූ බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදයේ නියෝජිත පොරවල් කරන හානිය දෙමවුපියන්ට නොදැනෙන්නේද? මේ පොරවලට හා ඔවුන් පසුපස යන්නන්ට අනුව මම සංස්කෘතික වශයෙන් පසුගාමී, ජාතිවාදී, අප්‍රබුද්ධ, අවිචාරශීලි, අව්‍යක්ත, ඔවුන්ට තරම් බුද්ධියක් නැති බටහිර සම්භාව්‍ය කෘතීන් පරිශීලනය නොකරන, එසේත් නැතහොත් ඒවා තේරුම් ගැනීමට තරම් බටහිර සාහිත්‍ය විචාරය ගැන දැනුමක් නැති, බටහිර මනෝ විශ්ලේෂණය නමින් හැඳින්වෙන දැනුම් පද්ධතිය ගැන නොදන්නා සමාජයීය විද්‍යාවන් ගැන අබමල් රේණුවක දැනුමක් නැති, එසේත් නැතහොත් ඔවුන්ට තේරෙන ඒ කෘති ලියා ඇති ව්‍යක්ත ඉංගිරිසිය තේරුම් ගත නොහැකි, බටහිර ගණිතය ගැන ටිකක් ඉගෙන ගෙන ඇති, උපාලි පුවත්පත්වලට වල්පල් ලියන, බුද්ධිමය ත්‍රස්තවාදියෙක්මි. ඊනියා ප්‍රබුද්ධයන් සියල්ලන්ම ඒකාකාරීව එලෙස නොසිතන නමුත්, ඒ ඒ පොර අඩු වැඩි වශයෙන් එලෙස සිතන බව රහසක් නොවෙයි. ඔවුන් එසේ සිතීම ගැන මා ආඩම්බර වන්නේ මට බොරු නිහතමානි බවක් නැති බැවිනි. මා ඒ ලැයිස්තුවට තවත් එකක් එකතු කළ යුතුය. මා දන්නා බටහිර ගණිතයක් ද නැත. එහෙත් කිනම් හේතුවක් නිසා හෝ විශ්වවිද්‍යාලයකින්

රැකියාවක් දී ඇති බැවින් මම බඩවියත රැක ගැනීමටම නොවුණද බිරියට හා දරුවන්ට බරක් නොවීම සඳහා බටහිර ගණිතය විශේෂයෙන් ම ව්‍යවහාරික ගණිතය විකුණන්නෙමි. එහෙත් මා බටහිරින් හෝ වෙන තැනකින් හෝ ලැබෙන කිසිම මුදලකටවත්, සම්මානයකටවත්, පොරත්වයකටවත්, ජාතිය විකිණීමට සූදානම් නැත.දැනට අවුරුදු විස්සක පමණ කාලයක් තිස්සේ අපේ දැනුමක් නිර්මාණය කර ගැනීමට මා මහන්සි වන්නේ ජාතියකට අවසාන වශයෙන් ගත් කල නිදහස ලැබීමට නම් තමන්ගේ ප්‍රවාද, සංකල්ප ආදිය තිබිය යුතු බැවිනි. පසුගිය අවුරුදු විස්ස පුරා මා විසින්

© Prof. Nalin De Silva

නිර්මාණය කෙරී ඇති දැනුම වෙයි. ඊනියා ප්‍රබුද්ධයන් ඒ නොපිළිගන්නා බව මම දනිමි. ඒ පිළිබඳ මම කම්පා නොවෙමි. මට කම්පාවක් ඇති වන්නේ ඔවුන් ඒ පිළිගතහොත්ය. සිරස ගුවන් විදුලි නාලිකාවක් ලෙස ඇරඹූ අවධියෙහි ද අපට අපේ ප්‍රවාද එතරම් නො තිබිණි. එහෙත් එකලම සිරස යනු මෙරට සිංහල බෞද්ධ සංස්කෘතිය විනාශ කිරීමට ඇරඹුවක් ලෙස අපි හැඳින්වීමු. ඒ සඳහා අවශ්‍ය දැනුමක්, (එල්ලයක් නැතිව පොලු ගැසීමක් නොව) එකල ද අප සතුවිය. සිරස බටහිර ක්‍රිස්තියානි නූතනත්වය හා එහි ප්‍රතිඵලයක් වූ බටහිර ක්‍රිස්තියානි යටත් විජිතවාදය වෙනුවෙන් සේවය කරයි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට මම මූලික වශයෙන් විරුද්ධ වෙමි. අද බටහිරයන් අප පාලනය කරන්නේ තුවක්කුවේ ආධාරයෙන් නො වෙයි. ඔවුන් ඒ සඳහා යොදාගන්නේ ඔවුන්ගේ දැනුම ය. ඔවුන්ගේ විද්‍යාවය. ඔවුන්ගේ කලාව ය. ඔවුන්ගේ දර්ශනය ය. අද ඊනියා භාෂණ කලා අයිතියක නාමයෙන් ඕනෑම ප්‍රබුද්ධයකු යැයි හැඳින් වන්නකුට බටහිර ක්‍රිස්තියානි නූතනත්වය සංස්කෘතිය ප්‍රචලිත කරන ඊනියා කලා නිර්මාණ කිරීමේ වරම ඇත. අපි මේ අයිතියට අභියෝග කරමු. මේ ඊනියා අයිතිය ඇත්තේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියට ගැලපෙන අදහස්, ආකල්ප ආදිය ප්‍රචලිත කිරීම සඳහා ය. මේ රටේ සංස්කෘතියට ගැලපෙන අදහස් ප්‍රචාරයට වැට බැඳීමට ඒ ඊනියා අයිතිය ම ප්‍රයෝජනයට ගන්නා ආකාරය මම කොළඹ විශ්වවිද්‍යාලයේ දී අත් දුටුවෙමි. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට විරුද්ධ වන්නේ ප්‍රතිගාමීන් යැයි ඊනියා ප්‍රබුද්ධයන් කියනු ඇත. එහෙත් ප්‍රතිගාමී යන්නද වෙනත් වචන මෙන්ම සාපේක්ෂ වූවකි. අනුරාධපුරයේ සිට කොළඹ බලා යන්නකුට අනුරාධපුරයට යෑම අනෙක් පැත්තට යෑමකි. ඒ වාස්තවික ප්‍රතිගමනයක් විය හැක්කේ කොළඹ බලා යෑම වාස්තවික ඉදිරි ගමනක් නම් ය. කොළඹ බලා යෑම වාස්තවිකව ඉදිරියට යෑමක් යැයි තීරණය කළේ නිව්ටන්ද, අයින්ස්ටයින්ද, ඩාවින් ද, මාක්ස් ද, ෆ්‍රොයිඩ්ද, ලැකාන් ද එසේත් නැත්නම් ප්‍රබුද්ධයන්ගේ අප්පච්චිලා ද? යෑමට වාස්තවිකත්වයක් ඇති මොවුන්ට වාස්තවික වන්නේ කාගේ බඩ යෑමද? දියුණුව යනුවෙන් මොවුන් දන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ රටවල් ලබාගෙන ඇති තත්ත්වයයි. ඒ දියුණුව ලෙස නිර්වචනය කළෝ කවුරුහුද? ලෝකයට ම හිමි වාස්තවික දියුණුවක් තිබේද? අපට අපේ දියුණුව කුමක්විය යුතු දැයි තීරණය කිරීමට ඉඩ නොදීම බටහිර දියුණුවේ ලක්ෂණයක් වෙයි.

රටක්, ජාතියක් රැකෙන්නේ ඒ රටේ සාරධර්ම රැකුණහොත් ය. සාරධර්ම ද වෙනස්වන බව බටහිර නූතනත්ව ඒජන්තයන් සිංහල බෞද්ධයන්ට ඉගැන්විය යුතු නොවෙයි. මෙහි රැකුණහොත් යන්නෙන් අදහස් වන්නේ අවශ්‍ය වුවහොත් වෙනස් කිරීමට ජාතියට ඇති අයිතිය රැකීමය. ඒ අයිතියද තිබිය යුත්තේ බටහිරයන්ට යැයි කියන්නා අද බාලයෙක් ම වෙයි. අද මෙරට දූෂණය, වංචාව, නාස්තිය ආදිය හිස වසාගොස් ඇත්නම් එයට හේතුව අපේ සාරධර්ම බටහිරයන්ට අවශ්‍ය ආකාරයට යම් ප්‍රමාණයකට දියකර හැරීම ය. එහිදී බටහිරයන් ඇති කළ පාසල් හා විශ්වවිද්‍යාල විසින් කෙරී ඇති කාර්යය සුළුපටු නොවෙයි. රටක් ජාතියක් නීතියෙන් විනයගරුක කළ නො හැකිය. විනයගරුක බව, ශිෂ්ටත්වය, සාරධර්ම එකිනෙක හා බැඳී ඇත. රටක සාධර්මවලට හිනැහී ඒවා ප්‍රතිගාමී යැයි නම්කර රටක් ශිෂ්ට කළ නොහැකිය. මගේ අර්ථ දැක්වීමට අනුව බටහිර ක්‍රිස්තියානි රටවල් අද ඉතාමත් නොදියුණු රටවල් වෙයි. ඊනියා ප්‍රබුද්ධයන්ට නැවතත් කිවයුත්තේ බඩ යෑමට මෙන් ම දියුණුවටත් වාස්තවිකත්වයක් නැති බව ය. ඊනියා යථාර්ථවාදී දියුණුවක් ලෝකයේ නොව විශ්වයේ කොහේවත් නැත. රටක සාරධර්ම බොහෝ විට රැකෙන්නේ ගැහැණුන් අතින්ය. මෙරට අද මේ ප්‍රමාණයටවත් සාරධර්ම දියවී නැත්තේ ගැහැණුන් නිසාය. මේ ප්‍රතිගාමී අදහසක් යැයි ද, ගැහැණුන්ගේ නිදහස නැති කිරීමක් යැයි ද, ගැහැණුන් ඇන්දවීමක් යැයි ද ඊනියා පශ්චාත්වාදීන් ඇතුළු අනෙකුත් ප්‍රබුද්ධයන් කියනු ඇත. ගැහැණුන් නිරුවත් කිරීම ඊනියා ප්‍රබුද්ධයන්ගේ ප්‍රතිපත්තිය වුව ද මගේ ප්‍රතිපත්තිය නොවෙයි. අද ඇතැම්හු මෙරට සාරධර්ම රඳවා ඇති නාදැත්ත වූ ගැහැණිය බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දැත්තක් කිරීමට වෙහෙසෙති. ගැහැණුන්ට දීමට දඟලන ඊනියා නිදහස යනු අන්කිසිවක් නොව සිංහල බෞද්ධ සංස්කෘතිය බිඳ දමා බටහිර ක්‍රිස්තියානි සංස්කෘතිය අනුකරණය කිරීමේ නිදහස ය. සුපර්ස්ටාර් තරගයෙන් ගායිකාවන් ඈත් කළේ ඇතැමුන් දකින ආකාරයට ගැහැණුන්ට තැන නොදීමට නොව, ඊනියා සිහින කුමරුන් හඹායන බටහිර ගැහැණුන් අනුකරණය කරමින් සිහින කුමරුන් නිසා ආවේශවීමෙන් යටිගිරියෙන් කෑගසන, මනෝ විකෘතීන්ට (අපට සාපේක්ෂව) භාජන වී තමන්ට හානි කරගන්නා තරුණයන් කැලක් බිහි කිරීමට මිස නැගී එන තරුණයන්ට අත දීමට නොවෙයි. ජාතියේ අනාගත මවුවරුන් වන්නේ මේ තරුණියන්ය. ඊයේ පෙරේදා "ප්‍රතිගාමී" හිරු දෙවිගේ ගමන (හිරු යන්නේ මොන ගමනක්ද? යන්නේ පෙළොව නොවැ, හෞ මොවුන් දන්නා වාස්තවිකත්වයක තරම) වෙනුවෙන් උත්සව පැවැත්වූ ජාතියක් බටහිර "ප්‍රගතිශීලී" කාම දෙවියන්ගේ අල්තාරය අබියස බිලිදීම සුපර්ස්ටාර් පසුබිමේ වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva